# ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ දියුණුව කෙරෙහි පුරාවිද්‍යාත්මක උරුමය බලපාන්නේ කෙසේද? (ගාලු කොටුව ඇසුරෙන්)

එල්.සී. ප්‍රියදර්ශනී

ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
ldcpriyadarshani@gmail.com

**මුඛ්‍ය පද** - සංචාරක ව්‍යාපාරය , පුරාවිද්‍යාත්මක උරුමය, ගාලු කොටුව, ශ්‍රී ලංකාවේ යටත් විජිත පාලන සමය.

## හැඳින්වීම

ශ්‍රී ලංකා ආර්ථිකයේ වැදගත්ම අංශය ලෙස සංචාරක කර්මාන්තය සඳහන් කළ හැකි අතර සංචාරක කර්මාන්තය තුන්වන විශාලතම විදේශ විනිමය උපයන අංශය ලෙස සඳහන් කළ හැකි ය. සංවර්ධනය වෙමින් පවතින රටක් වන ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සංචාරක ව්‍යාපාරයෙන් ලැබෙන ඍජු හා වක්‍ර දායකත්වය සුවිශාල වේ. ඉන්දියන් සාගරයේ මුතුඇටය නම් විරුදාවලිය ලත් ශ්‍රී ලංකාව සංචාරක ආකර්ෂණය දිනාගත් කේන්ද්‍රස්ථානයක් වන අතර පුරාවිද්‍යාත්මක වටිනාකම් බොහෝමයකට හිමිකම් කියයි. එකී පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත ස්ථාන සංචාරකයන්ගේ ආකර්ෂණය දිනාගත් සුවිශේෂී අංගයකි. ශ්‍රී ලංකාවේ සංචාරක ආකර්ෂණය දිනාගත් පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති ස්ථාන අතර දකුණු වෙරළ තීරයට හිමිකම් කියන ගාල්ල දිස්ත්‍රික්කයේ පිහිටි ගාලු කොටුව සුවිශේෂී ස්ථානයක් වේ. යුනෙස්කෝ ලෝක උරුම අඩවියක් ලෙස ගාලු කොටුව සඳහන් කළ හැකිය (කුලතිලක, දිසානායක, පෙරේරා, මෙනඩිස්, 2022). එය 16 වන සියවසේ දී පෘතුගීසින් විසින් ඔවුන්ගේ ජයග්‍රහණය අතරතුර ඉදිකරන ලද බලකොටුවක් වන අතර පසුව 17 වන සියවසේ දී ලන්දේසීන් විසින් ශක්තිමත් කර ඇත. ඉන්පසු බ්‍රිතාන්‍යයන්ගේ ආක්‍රමණයත් සමග මෙහි බලය බ්‍රිතාන්‍යයන් අතට පත්විය. පැරණි ගාල්ල නගරය වසර දෙසීයකට අධික කාලයක් කුළුබඩු සහ වෙනත් භාණ්ඩ සඳහා වෙළෙඳ වරායක් විය. අද වන විට මෙම ඓතිහාසික පුරවරය දේශීය හා විදේශීය සංචාරකයන්ගේ ආකර්ෂණය දිනාගත් ස්ථානයක් බවට පරිවර්තනය වී ඇත. මෙම ගාලු ලන්දේසි කොටුවේ නිමක් නැති සුන්දර කතන්දර, ජනප්‍රවාද සහ ඇතැම් රහස් පුවත් සංචාරකයන්ගේ කුතුහලය වර්ධනය කිරීමට ඉවහල් වී ඇති බව ගම්‍ය විය. එබැවින් සංචාරක කර්මාන්තයේ උන්නතිය උදෙසා ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත ස්ථාන ඍජුව හා වක්‍රව බලපාන්නේ කෙසේද යන්න පුළුල්ව අධ්‍යයනය කිරීම මෙහි අරමුණයි. එහිදී අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස ගාලු කොටුව තෝරා ගන්නා ලදී. ඒ අනුව සත්‍යය වශයෙන්ම ගාලු කොටුව සංචාරක ආකර්ෂණය දිනාගත් ස්ථානයක් ද, එහි පුරාවිද්‍යාත්මක වටිනාකමක් පවතින්නේ ද සහ එය සංචාරක ආකර්ෂණය වැඩි දියුණු කිරීමට හේතු වන්නේ ද යන පර්යේෂණ ගැටලු ඔස්සේ මෙම අධ්‍යයනය සිදු කර ඇත.

## ක්‍රමවේදය

යථෝක්ත පර්යේෂණ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා ගොඩනගා ගත් පර්යේක්ෂණ ගැටලු ඔස්සේ පළමු පියවර ලෙස දත්ත රැස් කරන ලදී. ඒ අනුව ගාලු කොටුවේ ඇති පුරාවිද්‍යාත්මක පසුබිම් පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා දත්ත රැස්කර ගත් සාහිත්‍යය මූලාශ්‍ර ලෙස පුවත්පත් ලිපි, සඟරා, මෙම අධ්‍යයනය හා සම්බන්ධ පූර්ව පර්යේෂණ සහ ජනප්‍රවාද සඳහන් කළ හැකි ය. එමෙන්ම ගාලු කොටුව සංචාරක නිකේතනය කර ගත් දේශීය හා විදේශීය සංචාරකයන්ගේ ස්වභාවය අධ්‍යයනය කිරීමට ඍජු නිරීක්ෂණ සහ වෙනත් පූර්ව පර්යේෂණ වාර්තා භාවිතා කළ අතර එහි පුරාවිද්‍යාත්මක පසුබිම කෙරෙහි එම සංචාරකයන්ගේ ආකල්පය කෙසේ ද යන්න අධ්‍යයනය කිරීමට සම්මුඛ සාකච්ඡා, කණ්ඩායම් සාකච්ඡා, ඍජු නිරීක්ෂණ සහ සිද්ධි අධ්‍යයනයන් භාවිත කළේය.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

ශ්‍රී ලංකාවේ ගාලු කොටුව 1988 දී යුනෙස්කෝව විසින් ලෝක උරුම අඩවියක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද්දේය. ශ්‍රී ලංකාවේ නිරිතදිග වෙරළට වන්නට පිහිටි ලෝක උරුමයක් වන ගාලු කොටුව 1505 දී දිවයිනට පැමිණි දොන් ලොරෙන්සෝ ද අල්මේදාගේ නායකත්වයෙන් යුත් පෘතුගීසි නායකයින් පිරිසක් විසින් ප්‍රථම වරට ඉදිකරන ලද්දේ මුහුදට නෙරා ඇති ගල් තලාවක් මතය. එය 1520 දී Swart Bastion (කළු කොටුව) හෝ Black Fort ලෙස හැඳින්වූයේ ය. පසුව එය 1667 දී ලන්දේසීන් විසින් ශක්තිමත් කර විශාල කරන ලදී. මෙය අක්කර 36 ක විශාල භූමි ප්‍රදේශයක් පුරා පැතිරී ඇති අතර ගාල්ලේ සියවස් ගණනක් පැරණි සංස්කෘතික සහ යටත් විජිත උරුමය ප්‍රදර්ශනය කරයි. මෙම පර්යේෂණයෙන් අනාවරණය වූ කරුණු අතර මේ ආශ්‍රිත ජෛව පුරාවිද්‍යාත්මක තොරතුරු සුවිශේෂී වේ. ගවේෂණ වාර්තාවලට අනුව මෙම ප්‍රදේශයෙන් අනාවරණය වූ විශාල මත්ස්‍යය අස්ථි, ගවයින්ගේ හකු සහ කටු, මිනිස් ඇට සැකිලි, දත් ආදියෙහි ස්වභාවය මෙන්ම ගොඩ ගත් සත්ත්ව හා මිනිස් සිරුරුවල සටහන් වූ කැපුම් සලකුණු වලින් මෙම ප්‍රදේශයේ පැවැති ප්‍රචණ්ඩකාරී සහ කඩාකප්පල්කාරී ස්වභාවය නිරූපණය කරයි. මෙවැනි පෞරාණික පුවත් දේශීය හා විදේශීය සංචාරක සිත් වඩාත් ආකර්ෂණය වීමට හේතු වන බව අපගේ අධ්‍යයනයෙන් අනාවරණය විය.

ගාලු කොටුවේ මූලාරම්භය පෞරාණික කාලයෙන් ගිලිහී ගිය ද ප්‍රාග් ක්‍රිස්තියානු සහ රෝම යුගවල එහි පැවැත්ම තහවුරු කරන පුරාවස්තු හරහා තවමත් නොනැසී පවතී. ඒ අනුව යුරෝපීයන් විසින් හමුදා බලකොටුවක් ලෙස ඉදිකරන ලද ගාලු කොටුවේ ගෘහ නිර්මාණ ශිල්පය ලන්දේසි ආභාෂය පිළිබිඹු කරයි. විසිතුරු වෙරන්ඩා සහ ආරුක්කු ජනෙල් එහිදී කැපීපෙනේ (සිල්වා, සමන්ති, සෙනෙවිරත්න, සංජීව, 2022). මෙම බලකොටුව අඳුරු ඝන ගල් බිත්ති වලින් ආරක්ෂා වූ දුර්ලභ ඓතිහාසික ආභරණයක් බව අනාවරණය විය. මෙම දුර්ලභ වාස්තුවිද්‍යාත්මක සාධක සංචාරක ආකර්ෂණය දිනා ගැනීමට හේතු වී ඇති බව මෙම අධ්‍යයනය තුළින් පැහැදිලි විය.

ලෝකය ඉදිරියේ ජාතියක සහ රටක අභිමානය වර්ධනය වන්නේ එහි පුරාවිද්‍යාත්මක වටිනාකම, සංස්කෘතිය සහ ස්වභාවික සුන්දරත්වය මතය. එකී කරුණුවලින් සමන්විත වූ ගාලු කොටුව දේශීය හා විදේශීය සංචාරකයින්ගේ ආකර්ෂණය දිනා ගත් ස්ථානයක් බව නිරීක්ෂණය විය. පුරාවිද්‍යාත්මක පසුබිම පිළිබඳ ඔවුන් තුළ ඇත්තේ ඉමහත් කුතුහලයකි. පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත ස්ථාන සංචාරක කර්මාන්තයේ වර්ධනයට සුවිශාල දායකත්වයක් සපයන බව මෙම අධ්‍යනයෙන් අනාවරණය වූ තොරතුරු මත නිගමනය කළ හැකිය.

**ආශ්‍රිත මූලාශ්‍රය**

ද සිල්වා ආර්. ඒ. එස්., සමන්ති, ඩබ්ලිව්., සහ සෙනෙවිරත්න (රුහුණු විශ්වවිද්‍යාලය), රුවන් සංජීව ජේ.එම්, 2022, ***ශ්‍රී ලංකාවේ ගාලු කොටුවේ ඇති ඓතිහාසික ගොඩනැගිලි ප්‍රතිනිර්මාණය කිරීමේ සහ අනුවර්තනය වීමේ ප්‍රතිභාවිතයේ සැලසුම් සහ ඉදිකිරීම් අභියෝග.***

සමන්ති කුලතිලක, නදීර දිසානායක, නිමල් පෙරේරා, ක්‍රිෂාන් මෙන්ඩිස්, 2022, ***ශ්‍රී ලංකාවේ ගාලු කොටුවෙන් ජෛව පුරාවිද්‍යා පුරාවිද්‍යා අවශේෂ***